aat SRI LANKA

**ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය**

# පරීක්ෂක වාර්තාව

අන්තර්මධ්‍ය විභාගය - ජූලි 2011

(56) ව්‍යාපාර නීතිය හා කලමනාකරණය

විෂයයේ

**ව්‍යාපාර නීතිය**

(Business Law)

---

## ප්‍රශ්න අංක 01

මෙම ප්‍රශ්නය අනු කොටස් 5 කින් සමන්විත වූ අතර එහි ගැටළුවලට පිළිතුරු සැපයීමට තිබුණි. සමස්ථයක් ලෙස මෙම ප්‍රශ්නයට බොහෝ දුරට හොඳින් පිළිතුරු සපයා තබුණද ප්‍රතිදේය පත්‍රක පිළිබඳ පැහැදිලි අවබෝධයක් නොතිබූ බව පෙනුණි.

## ප්‍රශ්න අංක 02

ගිවිසුම් නීතිය ඇසුරෙන් අසා ඇති මෙම ප්‍රශ්නයේ (a) කොටසින් බලාපොරොත්තු වී තිබුණේ "අර්පනය" නිර්වචනය කිරීමත් (b) කොටසින් ගැටළුවකට පිළිතුරු බලාපොරොත්තු වී තිබුණි. මෙයද ඉතාමත් සරල ප්‍රශ්නයකි. බොහෝ අයදුම්කරුවන් සාර්ථකව පිළිතුරු සැපයීමට සමත් විය. එහෙත් (c) කොටසට නිවැරදි පිළිතුරු සැපයීමට බොහෝ අයදුම්කරුවන් අසමත් වී තිබුණි.

## ප්‍රශ්න අංක 03

භාණ්ඩ විකිණීමේ ආඥා පනත යටතේ ප්‍රශ්නය නිර්මාණය වී තිබුණි. (a) සහ (b) වශයෙන් කොටස් දෙකකින් සමන්විත විය. (a) කොටසට බොහෝ අයදුම්කරුවන් සාර්ථකව පිළිතුරු සපයා තිබුණත් ව්‍යතිරේඛ සඳහන් කිරීමට අසමත් විය. (b) කොටසට සාර්ථකව පිළිතුරු සපයා තිබුණි.

## ප්‍රශ්න අංක 04

චෙක්පතක් සහ විනිමය බිල් පත්‍රයක් අතර ඇති වෙනස්කම් ගැන අසා තිබූ ප්‍රශ්නයකි. බොහෝ අයදුම්කරුවන් සාර්ථකව පිළිතුරු සැපයීමට සමත් විය. හොඳ අවබෝධයක් ඒ සම්බන්ධයෙන් තිබූ බව පැහැදිලි විය.

## ප්‍රශ්න අංක 05

නියෝජ්‍යත්වය පිළිබඳ ප්‍රශ්නයකි. බොහෝ අයදුම්කරුවන් සාර්ථකව පිළිතුරු සැපයීමට සමත් විය.

## ප්‍රශ්න අංක 06

කෙටි පිළිතුරු බලාපොරොත්තු වූ ප්‍රශ්නයකි.

(a) "වෘත්තීය සමිති" ගැන පැහැදිලි කිරීමේදී කම්කරුවන් නැතහොත් සේවකයන් අතර පමණක් ඇතිවන සමිතියක් යන්න පිළිබඳ පමණක් අයදුම්කරුවන් තේරුම් ගෙන තිබූ බව පැහැදිලි විය.

(b) "වැඩ වර්ජන" පිළිබඳවද බොහෝ අයදුම්කරුවන් සාර්ථකව පිළිතුරු සැපයීමට සමත් විය.

(c) "සාමූහික ගිවිසුම" පිළිබඳ පැහැදිලි අවබෝධයක් අයදුම්කරුවන් තුල නොවූ බව පෙනුණි. සාර්ථක ලෙස පිළිතුරු සපයා තිබුණේ ඉතා සුළු අයදුම්කරුවන් පිරිසකි.

(d) "පිට ලෑම" පිළිබඳව අයදුම්කරුවන් තුල පැහැදිලි අවබෝධයක් නොතිබුණි. එම නිසා මෙම කොටසට බොහෝ අයදුම්කරුවන් අසමත් විය.

**<u>සැලකිය යුතු පොදු කරුණු:</u>**

ව්‍යාපාර නීතිය ප්‍රශ්න පත්‍රය අයදුම්කරුවන්ට පිළිතුරු සැපයීමට අපහසු එකක් නොවේ.

කෙසේ වුවද ලකුණු දීමේදී අඩු ලකුණු ලබා ගැනීමට හේතු වී ඇත්තේ බොහෝවිට අසන ප්‍රශ්නයට නිවැරදි පිළිතුර නොව තමා දන්නා විෂය කරුණු සියල්ල ඉදිරිපත් කිරීම ය. බොහෝවිට විෂය කරුණු පිළිබඳව දැනුම තිබුණද පිළිතුරු ලිවීමේ අභ්‍යාස වල නොයෙදීම නිසා අයදුම්කරුවන්ට අඩු ලකුණු ලබා ගැනීමට සිදුවිය. එයට හේතු වන්නේ බොහෝ අයදුම්කරුවන් ප්‍රශ්න පත්‍රය අතට ගත්විට ප්‍රශ්නය හොඳට <u>කියවා</u> තේරුම් නොගැනීම ය. ප්‍රශ්නයට අදාල පිළිතුර නොව තමා දන්නා සියල්ල පිළිතුරු වශයෙන් ලිවීම අයදුම්කරුවන් ලබා ගන්නා ලකුණු අඩුවීමට හේතු වී ඇත.

කෙසේ නමුත් ඉතාමත් සාර්ථකව මෙම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු ලියූ අයදුම්කරුවන් සිටි බවත් ප්‍රකාශ කළ හැකි ය. එම නිසා මෙම ප්‍රශ්න පත්‍රය පිළිබඳ අඩුපාඩු කිව නොහැකිය. ඉතාමත් පැහැදිලි සරල ප්‍රශ්න පත්‍රයක් සකසා තිබුණු බව ප්‍රකාශ කළ හැකි ය. දේශන වලට සහභාගී වුවත් විභාගයට සූදානම්වීම හා ප්‍රශ්න තේරුම් ගැනීමට මීට වඩා සැළකිලිමත් වීම අවශ්‍ය වේ.

එම නිසා මෙම විෂය පිළිබඳ ප්‍රශ්න වලට උත්තර ලිවීමේදී උත්තර ලිවීමේ ක්‍රමය ගැනද අයදුම්කරුවන් ප්‍රගුණ කළයුතු බව සඳහන් කරනු කැමැත්තෙමු.

- * * * -